# මාධ්‍ය නිවේදනය

## ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව රක්ෂණ ක්ෂේත්‍රය හා එක්ව "ඩිජිටල් මෝටර් රථ රක්ෂණ කාඩ්පත" හඳුන්වා දෙමින්, ඩිජිටල් පාලනය සහ මහජන ආරක්ෂාව තහවුරු කිරීමේ ප්‍රමුඛත්වය ගනියි

ශ්‍රී ලංකාවේ ඩිජිටල් පරිවර්තන ගමන් මගෙහි සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය හා එක්ව මෙරට 'ඩිජිටල් මෝටර් රථ රක්ෂණ කාඩ්පත' නිල වශයෙන් එළිදක්වනු ලැබේ.

මෙම නිල එළිදැක්වීමේ උත්සවය මහජන ආරක්ෂක අමාත්‍ය ගරු ආනන්ද විජේපාල මහතාගේ ප්‍රධානත්වයෙන්, 2026 ජනවාරි 7 වන දින බත්තරමුල්ල, 'සුහුරුපාය' පිහිටි මහජන ආරක්ෂක අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පැවැත්වෙනු ඇත. පොලිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රධානීන්, මාධ්‍ය නියෝජිතයන් සහ අනෙකුත් ප්‍රධාන පාර්ශවකරුවන් පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වීමට නියමිතය.

මෙම වැඩපිළිවෙළ යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රථම 'ඩිජිටල් මෝටර් රථ රක්ෂණ කාඩ්පත' හඳුන්වා දෙනු ලබන අතර එය නුදුරේදීම දිවයින පුරා ක්‍රියාත්මක වනු ඇත. රජයේ ජාතික ඩිජිටල්කරණ වැඩසටහන සහ 'හරිත' (Go Green) ප්‍රතිපත්ති රාමුව සමග මෙම පියවර මනාව ගැළපෙයි. මෙම ඩිජිටල් රක්ෂණ කාඩ්පත මගින් භෞතික ප්ලාස්ටික් කාඩ්පත් භාවිතයේ අවශ්‍යතාවය ඉවත් වන අතර රක්ෂණ ඔප්පුහිමියන්, රක්ෂණ සමාගම් සහ නීතිය බලාත්මක කරන බලධාරීන් සඳහා වඩාත් ආරක්ෂිත, කාර්යක්ෂම මෙන්ම පරිසර හිතකාමී විසඳුමක් ද මේ හරහා ලැබේ.

**ඩිජිටල් මෝටර් රථ රක්ෂණ කාඩ්පතේ ප්‍රධාන ප්‍රතිලාභ**

- **පාරිසරික තිරසාරභාවය:** මිලියන සංඛ්‍යාත ප්ලාස්ටික් රක්ෂණ කාඩ්පත් වාර්ෂිකව මුද්‍රණය කිරීම සහ බෙදා හැරීම මෙයින් ඉවත් කෙරේ. එමගින් ජාතික පාරිසරික අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහාය වේ.
- **මෙහෙයුම් කාර්යක්ෂමතාව:** රක්ෂණ සමාගම්වල මුද්‍රණ සහ පරිපාලන පිරිවැය අඩු කරයි. මෙමගින් හිමිවන කාර්යක්ෂමතාවයේ වාසිය අවසානයේ රක්ෂණ ඔප්පු හිමියන් වෙත ලබා දීමට අවස්ථාව සැලසේ.
- **රක්ෂණ ඔප්පුහිමියන්ගේ පහසුව:** වාහන හිමිකරුවන්ට තමන්ගේ වලංගු රක්ෂණාවරණයේ විස්තර ඕනෑම අවස්ථාවක තම ජංගම දුරකථනය හරහා පහසුවෙන් ලබා ගැනීමට අවස්ථාව හිමි වේ.

මෙම පියවර මගින් පොලිස් නිලධාරීන්ට මධ්‍යගත ඩිජිටල් පද්ධතියක් හරහා මෝටර් රථ රක්ෂණාවරණයේ වලංගුභාවය ක්ෂණිකව පරීක්ෂා කිරීමට හැකියාව ලැබෙනු ඇත. එමෙන්ම, ව්‍යාජ රක්ෂණ ලේඛන භාවිතය සැලකිය යුතු ලෙස අඩු කිරීමටත්, මාර්ග ආරක්ෂාව ඉහළ නැංවීමට සහ මහජන ආරක්ෂාව තහවුරු කිරීමටද මෙය දායක වේ.

ඩිජිටල් මෝටර් රථ රක්ෂණ කාඩ්පත යනු හුදු තාක්ෂණික දියුණුවක් පමණක් නොව; එය රක්ෂණ ක්ෂේත්‍රය සහ නීතිය බලාත්මක කරන ආයතන පද්ධතිය තුළ විනිවිදභාවය, කාර්යක්ෂමතාව සහ වගවීම ප්‍රවර්ධනය කරන, විශ්වාසය ගොඩනැගීමේ පියවරකි. රක්ෂණ ඔප්පු හිමියන්ට සහ නීතිය ක්‍රියාත්මක කරන නිළධාරීන්ට විශේෂිත සත්‍යාපන පහසුකමක් හරහා මෝටර් රථ රක්ෂණ ඔප්පුවල වලංගුභාවය සත්‍යාපනය කිරීමට හැකි වේ. පරිශීලකයින්ට **2252** ඇමතීමෙන් රක්ෂණ සමාගම්වල ඇමතුම් මධ්‍යස්ථාන සම්බන්ධ කර ගත හැකි අතර එසේ

නැතහොත් **#2252** ඇමතීමෙන් USSD පාදක ඩිජිටල් සත්‍යාපන විසඳුමට ප්‍රවේශ විය හැකිය. එය ඉතාමත්ම නුදුරේදී ක්‍රියාත්මක වන අතර, එමගින් වේගවත් හා කාර්යක්ෂම මාර්ග පරීක්ෂාවක් සිදුකළ හැක.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සහ රක්ෂණ ක්ෂේත්‍රය අතර පවතින ශක්තිමත් සහයෝගීතාවය පිළිබිඹු කරමින් ශ්‍රී ලංකාවේ මෝටර් රථ රක්ෂණ ක්ෂේත්‍රයේ නව යුගයක ආරම්භය සනිටුහන් කරන අතර මහජන සුබසිද්ධිය, තිරසාරභාවය සහ ජාතික ආරක්ෂාව කෙරෙහි ප්‍රමුඛත්වය දෙමින් ඩිජිටල් නවෝත්පාදනය ඇතුළත් කර ගැනීම මෙහි අරමුණයි.

**ශ්‍රී ලංකා පොලිසිය වෙත ටැබ්ලට් පරිගණක යන්ත්‍ර 500 ක් ප්‍රදානය කිරීම**

ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය සහ එහි සාමාජිකත්වය දරණ සාමාන්‍ය රක්ෂණ සමාගම් 13 ක් එක්ව, පොලිස් දෙපාර්තමේන්තුව විසින් අළුතින් හඳුන්වා දෙනු ලබන **'රිය අනතුරු කළමනාකරණ පද්ධතිය'** ක්‍රියාත්මක කිරීම සඳහා ටැබ්ලට් පරිගණක 500 කට අධික ප්‍රමාණයක් ප්‍රදානය කිරීමට කටයුතු කරයි. මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත පිරිනමන මෙම දායකත්වය මගින් මාර්ග ආරක්ෂාව ඉහළ නැංවීමටත් අනතුරු වාර්තා කිරීමේ ක්‍රමවේද විධිමත් කිරීමටත් රක්ෂණ ක්ෂේත්‍රය දක්වන කැපවීම මනාව පැහැදිලි වේ. මෙම ටැබ්ලට් පරිගණක මගින් පොලිස් නිලධාරීන්ට අනතුරු පිළිබඳ දත්ත ඩිජිටල් තාක්ෂණය ඔස්සේ එසැණින් වාර්තා කිරීමට හැකි වන අතර එමගින් ලිඛිත ලේඛන මත යැපීම අඩු වී වාර්තාකරණයේ නිරවද්‍යතාව සහ වේගය ඉහළ යනු ඇත. රක්ෂණ ක්ෂේත්‍රය සහ නීතිය බලාත්මක කරන ආයතන අතර ඩිජිටල් සබඳතාව ශක්තිමත් කිරීම තුළින් මෙරට රියදුරන් වෙනුවෙන් වඩාත් විනිවිදභාවයකින් යුතු සහ කඩිනම් සේවාවක් සැපයීමට මෙමගින් මග පෑදේ.

**විකල්ප වන්දි ක්‍රමය**

මෙම ඩිජිටල් වැඩපිළිවෙළට සමගාමීව, රිය අනතුරුවලට ලක්වන තෙවන පාර්ශවීය වින්දිතයන් සඳහා කඩිනමින් වන්දි ලබා දීම වෙනුවෙන් ස්ථාපිත විකල්ප වන්දි ක්‍රමය වඩාත් පුළුල් කර ඇති බව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිවේදනය කරන ලදී. මේ යටතේ ගෙවිය හැකි උපරිම වන්දි මුදල රුපියල් මිලියන 1 දක්වා ඉහළ නංවා ඇත. මෙම පියවර මගින් පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීම, අනතුරට පත් වූවන් සඳහා කාලෝචිත මූල්‍ය සහනයක් සැලසීම සහ මෝටර් රථ රක්ෂණ පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය ඉහළ නැංවීම කෙරෙහි රක්ෂණ නියාමන කොමිෂන් සභාව දක්වන උනන්දුව යළි තහවුරු වේ.

**විශේෂ වැඩසටහන පිළිබඳ විස්තර**

**විශේෂ වැඩසටහන:** ශ්‍රී ලංකාවේ ඩිජිටල් මෝටර් රථ රක්ෂණ කාඩ්පත නිල වශයෙන් දියත් කිරීම සහ ශ්‍රී ලංකා පොලිසිය වෙත ඩිජිටල් ටැබ්ලට් පරිගණක 500 ක් ප්‍රදානය කිරීම

**දිනය:** 2026 ජනවාරි 7 වන බදාදා

**වේලාව:** ප.ව. 2.30

ස්ථානය: ශ්‍රවණාගාරය, 7 වන මහල, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, සුහුරුපාය, බත්තරමුල්ල

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**
**11 වන මහල,**
**නැගෙනහිර කුළුණ,**
**ලෝක වෙළඳ මධ්‍යස්ථානය,**
**කොළඹ 01.**

| වෙබ් අඩවිය: www.ircsl.gov.lk | ඊමේල්: info@ircsl.gov.lk |
| --- | --- |
| දුරකථනය: 011 2396184 - 9 | ෆැක්ස්: 011 2396190 |

2026.01.05